# රුහුණ විශ්වවිද්‍යාලය
## 2018 - 2019 ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි - 2000 ස්ථලය
## දෙවන සමාසික පරීක්ෂණය, 2020 මාර්තු

## SLS 22633 - භාරතීය කාව්‍ය විචාරය

කාලය පැය 03යි | ලකුණු 60යි

---

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න

01) පහත සඳහන් පද්‍ය පන්තිය භාරතීය කාව්‍ය විචාර සිද්ධාන්ත ආශ්‍රයෙන් විචාරය කරන්න.

ලෙළෙනා නන් දද වැද පුර අහසේ
සිටිනා පුර අඟනන් ගඟ දෙපසේ
කෙළනා ළඳ ලිය ගඟ දිය සිතසේ
දකිනා ත-ගෙ නෙත සිත වෙයි සතොසේ

සිත ලොබ වඩමින් දුටුදුටු වන්නේ
නිමල’ඹ තුරැ දිව වෙතට උනුන්නේ
ලෙළ පබ වත ගත කෙළන ළඳුන්නේ
ගන ගබ සිය රැළි විදුලිය වැන්නේ

ලෙළෙනා මෙන් ගඟ තරඟ කනාලිය
කෙළනා ලෙස එළි බැස දිව නාලිය
පිහිනා යන එන සොඳුරු මනාලිය
සොබනා රූ සිරු නොහැකි වනාලිය

මිනිසෙක් දිය පීනා යෙයි එතෙරට
අඟනක් දිය පීනා එයි මෙතෙරට
පහරක් දුන සරණින් ඔහු සිරසට
අනෙකක් ඇඹුවා එසඳෙහි දුර සිට

අඟනක පය ගෑ ලතු සිරසෙයි වැකි
මිනිසෙකු ගඟ දිය කෙළියෙන් නොවැළකි
අනෙකක ඇස රතු විය ලතු නොමවැකි
ඇයසක එතරට වෙන දිය කරණෙකි

(හංස සන්දේශය - දෙගම්මැද සුමනජෝති හිමි)

02) ලාංකේය සිංහල සම්භාව්‍ය සාහිත්‍යය කෙරෙහි භාරතීය අලංකාරවාදයෙහි බලපෑම ගද්‍ය හා පද්‍ය කෘති හතරක්වත් ආශ්‍රයෙන් පරීක්ෂා කරන්න.

03) "රසවාදය යනු හුදු මනෝභාව විග්‍රහයක් පමණක් මිස කාව්‍යයේ සෞන්දර්යය පරීක්ෂා කරන පරිපූර්ණ විචාරවාදයක් නොවේ" සනිදර්ශන ව සාකච්ඡා කරන්න.

04) "සාහිත්‍ය නිර්මාණයක ශබ්දය හෝ අර්ථය අප්‍රධානව ව්‍යංග්‍යාර්ථයක් ප්‍රකට වේ නම් එය ධ්වනිය යි" නිදසුන් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

05) "කාව්‍යයේ රස භංගත්වයට පාදක වන මුඛ්‍ය සාධකය අනෞචිත්‍යය යි" අභිමත නිදසුන් පහක් ඇසුරෙන් විමසන්න.

06) පෙරදිග කාව්‍ය විචාරයේ 'ගුණ - රීති සංකල්පය' පැහැදිලි කොට ඒ සම්බන්ධයෙන් වාමනයන් දැක්වූ අදහස් සැකෙවින් පහදන්න.

07) 'වක්‍රෝක්තිවාදය' යනු කුමක් දැයි පැහැදිලි කොට ඒ පිළිබඳ පසුකාලීන භාරතීය විචාරක මත සමාලෝචනය කරන්න.

08) අභිමත මාතෘකා තුනකට (03) කෙටි සටහන් ලියන්න.

i.අවිවක්ෂිතවාච්‍යධ්වනි

ii.යෝග්‍යතා, ආකාඞ්ක්ෂා, ආසත්ති

iii.භාමහ ආචාර්යවරයා

iv.පර්යායෝක්ත්‍යලංකාර

v.ශෘංගාර රසය

*(සෑම පිළිතුරකටම ලකුණු 12 බැගිනි)*